## වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

# පුරප්පාඩු

**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (සතොස) පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. කළමනාකරු - මානව සම්පත් (ප්‍රධාන කාර්යාලය)

**වැටුප් පරිමාණය** - MM 1-1 - 2025 Rs. [91,690- 10 X 2480 - 15 X 3450 - 168,240]

**සුදුසුකම්**

මානව සම්පත් කළමනාකරණය, වාණිජ්‍යය, රාජ්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ තනතුර සම්බන්ධයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

### 02. අභ්‍යන්තර විගණක (ප්‍රධාන කාර්යාලය)

**වැටුප් පරිමාණය** - MM 1-1 - 2025 Rs. [91,690- 10 X 2480 - 15 X 3450 - 168,240]

**සුදුසුකම්**

(I) ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය හෝ රාජ්‍ය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

(II) පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක අතරමැදි විභාගය සමත් වී තිබීම සහ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ තනතුර සම්බන්ධයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

### 03. ගණකාධිකාරී (ප්‍රධාන කාර්යාලය)

**වැටුප් පරිමාණය** - MM 1-1 - 2025 Rs. [91,690- 10 X 2480 - 15 X 3450 - 168,240]

**සුදුසුකම්**

(I) ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය හෝ රාජ්‍ය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ තනතුර සම්බන්ධයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

(II) පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අතරමැදි විභාගය සමත් වීම සහ රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ තනතුර සම්බන්ධයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

### 04. කළමනාකරු -මෙහෙයුම් (පුරප්පාඩු 04)

(ප්‍රධාන කාර්යාලය සහ කුරුණෑගල, මාතර සහ පෑලියගොඩ තොග වෙළඳ මධ්‍යස්ථාන)

**වැටුප් පරිමාණය** - MM 1-1 - 2025 Rs. [91,690- 10 X 2480 - 15 X 3450 - 168,240]

**සුදුසුකම්**

(I) අලෙවිකරණය, ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ වාණිජ්‍යය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ තනතුර සම්බන්ධයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

(II) පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අතරමැදි විභාගය සමත් වීම සහ රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ තනතුර සම්බන්ධයෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

### 05. නීති නිලධාරි (ප්‍රධාන කාර්යාලය)

**වැටුප් පරිමාණය** - MM 1-1 - 2025 Rs. [91,690- 10 X 2480 - 15 X 3450 - 168,240]

**සුදුසුකම්**

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම, දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු ක්‍රියාකාරී වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

### 06. කළමනාකරු - තොරතුරු තාක්ෂණ (ප්‍රධාන කාර්යාලය)

**වැටුප් පරිමාණය** - MM 1-1 - 2025 Rs. [91,690- 10 X 2480 - 15 X 3450 - 168,240]

**සුදුසුකම්**

(I) තොරතුරු තාක්ෂණය, තොරතුරු විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ ඉංජිනේරු යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ පළමු උපාධියෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමෙන් අවම වශයෙන් වසරක පළපුරුද්ද ලබා තිබීම.

(II) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළව අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

✷ **2024.01.12** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව

ඉහත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් නමා විසින් පිලියෙල කරගත් අයදුම්පතක් **2026.06.08** දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුරු නාමය දැක්විය යුතුය.

**සභාපති,**
**සමුපකාර තොග වෙළඳ සංස්ථාව,**
**27, වොක්ෂෝල් වීදිය,**
**කොළඹ 02.**